Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**8 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සෞරග්‍රහ ග්‍රහ මණ්ඩලයේ පිහිටි මතුපිට උෂ්ණත්වය අධිකතම ග්‍රහලෝකය මින් කුමක් ද?

(1) අඟහරු (2) බුධ (3) සෙනසුරු (4) සිකුරු

02 අභ්‍යන්තර ග්‍රහලෝක අතර විශාලම ග්‍රහලෝකය වන්නේ මින් කුමක් ද?

(1) බ්‍රහස්පති (2) සිකුරු (3) පෘථිවි (4) බුධ

03 සාර්ක් සංවිධානයට අයත් මධ්‍යම ආසියාතික රට වන්නේ මින් කවරක් ද?

(1) නේපාලය (2) ඇෆ්ගනිස්ථානය (3) භූතානය (4) බංගලාදේශය

04 පහත දැක්වෙන රටවල් අතරින් සම්මත වේලා කලාප කිහිපයකට ඇතුළත් වන රට කුමක්දැයි තෝරන්න.

(1) පෘතුගාලය (2) නවසීලන්තය (3) මැඩගස්කරය (4) කැනඩාව

05 දකුණු ආසියා කලාපයේ කඳුකර භූ දර්ශනය දක්නට නොලැබෙන රටකි.

(1) මාලදිවයින (2) ශ්‍රී ලංකාව (3) නේපාලය (4) භූතානය

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( ✗ ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 ආලෝකය හා ශක්තිය නිකුත් කරන සූර්යාද තාරකාවකි. ( )

07 සිකුරු පෘථිවියට ආසන්නතම ග්‍රහලෝකයයි. ( )

08 පෘථිවිය දේශාංශ පදනම්කරගත් සම්මත වේලා කලාප 25 කට බෙදා ඇත. ( )

09 සමස්ථ පෘථිවි තලයෙන් 3% භූමි ප්‍රමාණයක් දකුණු ආසියාවට අයත් වේ. ( )

10 තිම්පු පාකිස්ථානයේ අගනුවරයි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

11 සෞරග්‍රහ මණ්ඩලයේ සිකුරු සහ .......................................... නැගෙනහිර සිට බටහිරට භ්‍රමනය වන ග්‍රහලෝක වේ. (අඟහරු / සෙනසුරු / යුරේනස්)

12 ක්‍රි.ව. 2006 දී අන්තර් ජාතික තාරකා විද්‍යා සංගමය විසින් .......................................... වාමන ග්‍රහයෙකු ලෙස නම් කරන ලදී. (ප්ලූටෝ / නෙප්චූන් / එරිස්)

13 ඉහළ වායුගෝලයේ ඇති ............................................. වායු ස්තරය ජීවීන්ට අහිතකර පාර ජම්බුල කිරණ පෘථිවිය කරා ඒම පාලනය කරයි. (ඕසෝන්/ නයිට්‍රජන් / ආගන්)

14 පෘථිවි භ්‍රමණයේදී මාර්තු 21 දින සහ ............................................. දින සමකයට හිරු මුදුන්වීම සිදුවේ. (දෙසැම්බර් 22 / සැප්තැම්බර් 23 / ජූනි 21)

15 දකුණු ආසියා කලාපයේ විශාලම රට ................................................................................. යි. (ඉන්දියාව / බංගලාදේශය / පාකිස්ථානය)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදන්න.**

16 දකුණු ආසියා කලාපයේ ප්‍රධාන වශයෙන් පවතින්නේ ......................................... දේශගුණයයි.

17 ජලය ගොඩබිම හා වායුගෝලය අතර චක්‍රීයව සංසරණය වීම ......................................... ලෙස හැඳින්වේ.

18 පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීම ......................................... ලෙස හැඳින්වේ.

19 පෘථිවි වායුගෝලයේ 20.95% ප්‍රතිශතයක් ඇත්තේ ......................................... වායුවයි.


20 සමකයට ......................................... දිශාවෙන් දකුණු ආසියා කලාපය පිහිටා ඇත.

## II කොටස

**සැලකිය යුතුයි**


- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (අ) පහත රූප සටහනේ A - G දක්වා අක්ෂරවලින් දැක්වෙන ප්‍රධාන අක්ෂාංශ නම් කරන්න.




A ......................
B ......................
C ......................
D සමකය
E ......................
F ......................
G ...................... (ල. 06)

(ආ) (i) පහත රූපසටහනේ දැක්වෙන හිරු මුදුන් වන දිනයන්ට අදාළ වන සූර්ය විෂුවයන් හා සූර්ය නිවෘත්තීන් A, B, C, D වලින් දැක්වෙන හිස්තැන් මත ලියන්න.




(ii) E අක්ෂරයෙන් දැක්වෙන ගමන් මාර්ගය හඳුන්වන නම කුමක් ද? (ල. 10)

02 සෞරග්‍රහ මණ්ඩලය ආශ්‍රිතව තොරතුරු ඇසුරින් පහත දී ඇති සටහන සම්පූර්ණ කරන්න.

| සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා | අභ්‍යන්තර ග්‍රහලෝක | බාහිර ග්‍රහලෝක | වාමන ග්‍රහයින් | පාෂාණ කැබලිති | පෘථිවියේ උපග්‍රහයා |
|---|---|---|---|---|---|
| 1. ............................... | බුධ<br>2. ...................<br>පෘථිවි<br>3. ................... | 4. ...................<br>සෙනසුරු<br>5. ...................<br>නෙප්චූන් | 6. ...................<br>7. ...................<br>හෝමියා<br>8. ...................<br>එරිස් | 9. ...................<br>ධූමකේතු<br>10. ................ | 11. ................. |

(ල.11)

03

අංක 01 

අංක 02 

(i) ඉහත පින්තූර වලින් දක්වෙන ඍතු දෙක අනුපිළිවෙලින් නම් කරන්න. (ල.04)

(ii) අංක 01 න් දක්වෙන පින්තූරයේ ඍතුව උතුරු අර්ධගෝලයේ රටවලට ඇතිවන්නේ කුමන මාසය වන විටද? (ල.01)

(iii) අංක 02 න් දක්වෙන ඍතුවේ ලක්ෂණ 03 ක් ලියන්න. (ල.06)

04 (i) පෘථිවි වායුගෝලයේ A තීරුවේ දක්වෙන වායු වර්ග වල ප්‍රතිශතයන් B තීරුවේ දක්වේ. A තීරුවට ගැලපෙන සේ B තීරුව යා කරන්න.

| | A තීරුව | B තීරුව |
|---|---|---|
| 1. | නයිට්‍රජන් | 20.95% |
| 2. | ඔක්සිජන් | 0.93% |
| 3. | ආගන් | 0.03% |
| 4. | කාබන් ඩයොක්සයිඩ් | 78.09% |

(ල.04)

(ii) වායුගෝලයේ ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)

(iii) වායු දූෂණයට බලපාන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල.03)


05



A



B



C

(i) ඉහත රූප සටහන්වලට අනුව පෘථිවියේ ජලය පවතින ආකාර A, B හා C ලෙස නම් කරන්න. (ල.03)

(ii) පෘථිවිය මත ජලයේ ව්‍යාප්තිය පිළිබඳ නිවැරදි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.


| | | |
|---|---|---|
| 1. | සාගර ජලය | .......................% |
| 2. | ....................................... | 1.97% |
| 3. | අයිස් තට්ටු ලෙස | .......................% |
| 4. | ....................................... | 0.03% |

(ල.04)

(iii) පෘථිවියේ පවතින මතුපිට ජලය මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාර 4 ක් දක්වන්න. (ල.04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 පහත උපකාරක පද අනුව ප්‍රහේලිකාව පුරවන්න.




<u>පහළට</u>

(1) ගිම්හාන ඍතුව මෙනමින්ද හඳුන්වයි.

(2) සමකයට 23½º උතුරින් ඇති අක්ෂාංශ රේඛාව වේ.

(3) ආකාශ වස්තු නිරීක්ෂණයට මෙය යොදා ගනියි.

(4) ආකාශ වස්තු අතර පාෂාණ කැබලිති විශේෂයකි.

(7) අභ්‍යාවකාශ ගවේෂණය සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ පිහිට වූ ආයතනයයි.

(9) ජීවීන්ගේ පැවැත්මට අතවශ්‍ය සාධකයකි.

<u>හරහට</u>

(5) නේපාලයේ අගනුවරයි.


(6) අඟහරු ග්‍රහයා හඳුන්වන වෙනත් නමකි.

(8) දකුණු ආසියානු කලාපීය සංවිධානය මේ නමින් හඳුන්වයි.

(10) වායු ගෝලයේ වැඩිම ප්‍රතිශතයක් ඇති වායුවයි.

(11) දකුණු ආසියාවේ බහුලවම දක්නට ඇති මානුෂ භූ දර්ශනයයි. (ල. 11)

07




(i) ඉහත සිතියමේ 1 - 7 දක්වා අංක වලින් දක්වෙන්නේ දකුණු ආසියාවට අයත් රටවල් සමූහයයි. ඒවා අනුපිළිවෙලින් නම් කරන්න. (ල.07)

1. ...................................................... 2. ......................................................

3. ...................................................... 4. ......................................................

5. ...................................................... 6. ......................................................

7. ......................................................

(ii) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ල.02)

1. උතුරින් .............................................. 2. දකුණින් ..............................................

3. නැගෙනහිරින් .................................... 4. බටහිරින් ..............................................

(iii) ශ්‍රී ලංකාව හා මාලදිවයින් හැරුණ විට දකුණු ආසියාවට අයත් ඉන්දියන් සාගරයේ පිහිටි දූපත් රාජ්‍ය දෙකක් නම්කරන්න. (ල.02)

1. ...................................................... 2. ......................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) සිකුරු　(02) පෘථිවි　(03) ඇෆ්ගනිස්ථානය　(04) කැනඩාව　(05) මාලදිවයින

(06) ✓　(07) ✓　(08) ✗　(09) ✓　(10) ✗　(11) යුරේනස්　(12) ප්ලූටෝ

(13) ඕසෝන්　(14) සැප්තැම්බර් 23　(15) ඉන්දියාව　(16) නිවර්තන　(17) ජල චක්‍රය

(18) පරිභ්‍රමණය　(19) ඔක්සිජන්　(20) උතුරු

(2 x 20 = 40)

## II කොටස

01 (අ) A. ආක්ටික් වෘත්තය　B. කර්කටන නිවර්ථනය
D. මකර නිවර්ථනය　E. ඇන්ටාර්ටික් වෘත්තය (ල.08)

(ආ) A. වසන්ත විෂුවය　B. සරත් විෂුවය
C. ගිම්හාන නිවෘත්තිය　D. සිසිර නිවෘත්තිය (ල.08)

02 1. සූර්යයා　2. සිකුරු　3. අඟහරු　4. බ්‍රහස්පති　5. යුරේනස්　6. ප්ලූටෝ　7. සෙරිස්　8. මාකේ මාකේ　9. ග්‍රහක　10. උල්කා　11. චන්ද්‍රයා (ල.11)

03 (i) 1. සරත් ඍතුව　2. සිසිර ඍතුව (ල.04)
(ii) සැප්තැම්බර් (ල.01)
(iii) කරුණු තුනක් දැක්වීමට (ල.06)

04 (i)

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. නයිට්‍රජන් | 20.95 |
| 2. ඔක්සිජන් | 0.93 |
| 3. ආගන් | 0.03 |
| 4. කාබන් ඩයොක්සයිඩ් | 78.09 |

(ල. 04)

(ii) ප්‍රයෝජන තුනක් දැක්වීමට. (ල.03)
(iii) මානුෂ ක්‍රියාකාරකම් දෙකක් දැක්වීමට. (ල.04)

05 (i) ඝන, ද්‍රව, වායු (ල.03)
(ii) 1. 97.5%　2. භූගත ජලය　3. 0.5%　4. මිරිදිය ජලය (ල.04)
(iii) ඕනෑම ක්‍රියාකාරකම් හතරක් සඳහා (ල.04)

06 <u>පහළට</u>
(1) ග්‍රීස්ම　(2) කර්කටක　(3) දුරදක්නය　(4) ග්‍රහක
(7) නාසා　(9) ජලය

<u>හරහට</u>
(5) කත්මන්ඩු　(6) රතුග්‍රහයා　(8) සාර්ක්　(10) නයිට්‍රජන්　(11) ග්‍රාමීය (ල. 11)

07 (i) 1. ඉන්දියාව　2. පාකිස්ථානය　3. බංගලාදේශය　4. නේපාලය
5. භූතානය　6. ශ්‍රී ලංකාව　7. මාලදිවයින (ල.07)
(ii) 1. හිමාලය කඳුපන්තිය　2. ඉන්දියන් සාගරය
3. බෙංගාල බොක්ක　4. අරාබි මුහුද (ල.02)
(iii) 1. නිකොබාර් දූපත්　2. අන්දමන් දූපත් (ල.02)